# ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය

## මහෝපාධ්‍යායයන් වහන්සේ ධුරය සඳහා අයදුම්පත්‍ර/නාමයෝජනා කැඳවීම

1995 අංක 37 දරන ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය (සංශෝධන) පනතින් සංශෝධනය කරන ලද 1981 අංක 74 දරන ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය පනතේ විධිවිධාන අනුව ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයයේ මහෝපාධ්‍යායයන් වහන්සේ වශයෙන් නායකත්වය භාරගැනීම සඳහා බෞද්ධ/පාලි අධ්‍යයන ක්ෂේත්‍රයේ විශිෂ්ට අත්දැකීම් සුදුසුකම් ලබා ඇති ධර්මධර, විනයධර භික්ෂූන් වහන්සේලාගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම තනතුරේ නිල කාලය වසර තුනකි.

ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයයේ ප්‍රධාන කාර්යාලය හෝමාගම, පිටිපන, මොරගහහේන පාරේ, අංක 37 දරන ස්ථානයේ පිහිටුවා ඇත.

මහෝපාධ්‍යායයන් වහන්සේ පූර්ණකාලීන නිලධරයෙක් වෙති. උන්වහන්සේ විශ්වවිද්‍යාලයයේ ප්‍රධාන විධායක නිලධරයා, ප්‍රධාන ශාස්ත්‍රීය නිලධරයා හා ප්‍රධාන ගණන් දීමේ නිලධරයා වේ. උන්වහන්සේ නිල බලයෙන් පාලක සභාවේ හා සනාතන සභාවේ සාමාජිකයෙක් ද සභාපති ස්වාමීන් වහන්සේ ද වෙති.

<u>අයදුම්කරුවන් විසින් සම්පූර්ණ කළ යුතු මූලික සුදුසුකම්</u>

1. සෑම අයදුම්කරුවෙකුම ශ්‍රී ලාංකික පුරවැසිභාවය සහිත, අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට වයස අවුරුදු 62 නොඉක්ම වූ උපසම්පදාවෙන් දසවස් සපිරි භික්ෂූන් වහන්සේ නමක් විය යුතු ය.

2.

   i. අයදුම්කරු අභ්‍යන්තර අයදුම්කරුවෙකු නම් ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයයේ ස්ථිර සේවයෙහි නියුතු, සම්මාන ආචාර්ය උපාධියක් නොවන ආචාර්ය උපාධියක් සහිත ධර්මධර, විනයධර භික්ෂූන් වහන්සේ නමක් විය යුතු ය.

   ii. අයදුම්කරු බාහිර අයදුම්කරුවෙකු නම් බෞද්ධ හා පාලි අධ්‍යයන ක්ෂේත්‍රයේ විශිෂ්ට සුදුසුකම්වලින් යුතු, අදාළ විෂය ක්ෂේත්‍රයෙහි සම්මාන ආචාර්ය උපාධියක් නොවන ආචාර්ය උපාධියක් සහිත ධර්මධර, විනයධර භික්ෂූන් වහන්සේ නමක් විය යුතු ය.

මහෝපාධ්‍යායයන් වහන්සේ කලින් ඉවත් කළහොත් හෝ සේවය අත්හැරියහොත් හැර වසර තුනක කාලයක් සඳහා පත් කරනු ලබන අතර, උන්වහන්සේ වයස අවුරුදු 65 සම්පූර්ණ වනතුරු හෝ මහෝපාධ්‍යාය තනතුරේ කාලය අවසන් වනතුරු හෝ යන දෙකින් පූර්වයෙන් එළඹෙන දිනය තෙක් සේවය කළ යුතු වේ.



Scanned with CamScanner

වගකීම් හා කාර්යයභාරයන්

මහෝපාධ්‍යායයන් වහන්සේ අධ්‍යයන කටයුතු මෙහෙයවීම, කළමනාකරණ ප්‍රතිපත්ති හඳුන්වාදීම හා පාලක සභාවේ තීරණ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් වගකිව යුතු වෙති. තවද; විශ්වවිද්‍යාලයීය සාමාන්‍ය පරිපාලන, අධ්‍යයන විශිෂ්ටත්වය, පාරදෘශ්‍යභාවය, වගකීම, ප්‍රජාතාන්ත්‍රික කළමනාකරණය හා සඵල අපක්ෂපාති නායකත්ව මූලධර්ම අනුගමනය කිරීම අපේක්ෂා කරනු ලබයි.

ප්‍රබල පර්යේෂණ පැතිකඩක්, ප්‍රත්‍යක්ෂ නායකත්ව ගුණාංග හා විවිධ අභිරුචි කණ්ඩායම් සමඟ ගනුදෙනු කළ හැකි අන්තර් පෞද්ගලික නිපුණතා ප්‍රතිපත්තිමය කරුණු සම්බන්ධයෙන් පැහැදිලි අවබෝධයක් හා තීරණ සඵල පරිදි ක්‍රියාත්මක කිරීමේ කැපවීම ඇතුළු උසස් ශාස්ත්‍රාලයීය ජයග්‍රහණ වාර්තාවක් සාර්ථක අපේක්ෂකයා සතුව තිබිය යුතු වේ. ප්‍රජාව කෙරෙහි කැපවීම ඇතුළු විශ්වවිද්‍යාලයක ගුණාත්මකභාවය හා මෙහෙවර පිළිබඳ ගැඹුරු අවබෝධයක් උන්වහන්සේ වෙත තිබිය යුතුය.

මහෝපාධ්‍යායයන් වහන්සේ විශ්වවිද්‍යාලයේ ඉහළම වැටුප් තලයේ තැබීමට සුදුසුකම් ලබන අතර, මූලික වැටුපෙන් 15%ක සංග්‍රහ දීමනාව, තනතුරට අදාළ අනෙකුත් දීමනා සහ ප්‍රතිලාභ ලැබීමට හිමිකම් ලබති.

අයදුම්පත හෝ නාමයෝජනා පත්‍රය සමඟ පහත සඳහන් ලියකියවිලි ඉදිරිපත් කළ යුතු වේ.

1. අයදුම්කරුගේ උපන් දිනය, උපසම්පදාවට පත් වූ දිනය, අධ්‍යාපන සුදුසුකම්, ශාස්ත්‍රීය පර්යේෂණ හා ප්‍රකාශන, ඉංග්‍රීසි හා වෙනත් විදේශ භාෂා දැනුම, වෘත්තීය හා පරිපාලන කටයුතු පිළිබඳ පළපුරුද්ද ඇතුළත් කරන ලද ජීව දත්ත හා විශ්වවිද්‍යාලය පිළිබඳ ඉදිරි වසර 03ක් සම්බන්ධයෙන් ඉදිරිපත් කරනු ලබන දැක්ම, උප්පැන්න සහතිකයේ හා උපසම්පදා සහතිකයේ සහතික කරන ලද පිටපත්
2. ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ ප්‍රගමනය සඳහා ඉදිරිපත් කරන දැක්ම පිළිබඳ ප්‍රකාශනය හා විශ්වවිද්‍යාලයේ මහෝපාධ්‍යායයන් වහන්සේ වශයෙන් තේරීපත් වුවහොත් විශ්වවිද්‍යාලයේ අරමුණු ලඟා කරගැනීමට කටයුතු කරන ආකාරය පිළිබඳ කෙටි විස්තරයක් **(ජීව දත්ත තොරතුරු සමඟ වෙන වෙනම ඉදිරිපත් කළ යුතුය).**
3. නාමයෝජනාවක් නම්, නාමිකයාගේ කැමැත්ත සහිත ලිපියක්
4. අයදුම්කරු/නාමිකයා රාජ්‍ය සේවය, සමාගමක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක සහ ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයයේ හැර වෙනත් උසස් අධ්‍යාපන ආයතනයක සේවයෙහි නියුක්ත වන්නේ නම් අයදුම්කරු/නාමිකයා තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් උන්වහන්සේ සේවයෙන් නිදහස් කළ හැකි බවට සේවායෝජකයාගෙන් ලිපියක් ඉදිරිපත් කළ යුතුය.

සුදුසුකම් ලත් අයදුම්කරුවන්, තමන් මහෝපාධ්‍යාය ධුරයට තේරී පත්වුවහොත් ඉදිරි වසර තුනක කාලය සඳහා ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය මෙහෙයවන ආකාරය පිළිබඳව විනාඩි 15කට සීමාවූ සංක්ෂිප්ත ඉදිරිපත් කිරීමක් (Presentation) සඳහා විශේෂ පාලක සභා රැස්වීමක් හමුවට කැඳවනු ලැබේ.

අයදුම්පත්‍ර හෝ නාමයෝජනා **2025.01.27 දින ප.ව. 3.00ට හෝ ඊට ප්‍රථම "ලේඛකාධිකාරී, ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය, අංක 37, මොරගහහේන පාර, පිට්පන නගරය, හෝමාගම"** ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ පෞද්ගලිකව පැමිණ භාරදීම සිදුකළ යුතු වේ. **මෙම ලේඛනවල මෘදු පිටපත් (PDF), registrar@bpu.ac.lk විද්‍යුත් ලිපිනයට එවිය යුතුය.**



Scanned with CamScanner

**2025.01.27 දින ප.ව 3.00න් පසු ලැබෙන අයදුම්පත් හෝ නාමයෝජනා කිසිවක් විශ්වවිද්‍යාලය විසින් භාරගනු නොලැබේ.**

අයදුම්පත් හෝ නාමයෝජනා අදාළ ලේඛන බහාලන ලිපිකවරයේ ඉහළ වම් කෙළවරේ **"මහෝපාධ්‍යායයන් වහන්සේ ධුරය"** යනුවෙන් සඳහන් කළ යුතු වේ.

පත්කිරීම් සඳහා ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයීය 1995 අංක 37 දරන පනතින් සංශෝධිත 1981 අංක 74 දරන විශ්වවිද්‍යාල පනතේ විධිවිධාන අනුව මහෝපාධ්‍යායයන් වහන්සේනමක් පත් කර ගැනීම සඳහා 438වන පාලක සභාව විසින් අනුමත නිර්ණායක ප්‍රකාරව අයදුම්කරුවන්/නාමිකයන් අතරින් භික්ෂූන් වහන්සේලා තුන් නමකින් සමන්විත මූල මණ්ඩලයක් පාලක සභාව විසින් තෝරාගෙන අධ්‍යාපන අමාත්‍යාංශය වෙත දන්වනු ලැබේ. **මෙම මූල මණ්ඩලය තෝරාගැනීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ පාලක සභාවේ තීරණය අවසන් තීරණය වේ.**

**(අයදුම්පත් හා නාමයෝජනා සඳහා විස්තර www.bpu.ac.lk වෙබ් අඩවියට පිවිසීමෙන් ද ලබා ගත හැක.)**

ලේඛකාධිකාරී (වැඩබලන) හා පාලක සභා ලේකම්,
ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය,
හෝමාගම.
2024.12.27

Scanned with CamScanner